ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2015/01/30 |

## 2015 ජනවාරි මස උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ (කො.පා.මි.ද.) (2006/07=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය ආහාර මිල ගණන් ඉහළයාම හේතුවෙන් ලක්ෂ්‍යමය පදනම මත 2014 දෙසැම්බර් මස පැවති සියයට 2.1 හි සිට 2015 ජනවාරි මාසයේ දී සියයට 3.2 දක්වා ඉහළ ගියේය. වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2014 දෙසැම්බර් මස වාර්තා කළ සියයට 3.3 හි සිට 2015 ජනවාරි මාසයේ දී සියයට 3.2 දක්වා පහළ වැටිණි.



2015 ජනවාරි මාසයේ දී කො.පා.මි. දර්ශකයෙහි මාසික වෙනස සියයට 1.7 ක් වූ අතර නැවුම් ආහාර ද්‍රව්‍යවල මිල ගණන් ඉහළ යාම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. විශේෂයෙන්ම සියලුම වර්ගවල එළවළු, අමු මිරිස්, ලොකු ළූණු, රතු ළූණු, අර්තාපල්, බිත්තර සහ පොල් මිල ගණන් මෙම මාසය තුළ ඉහළ ගියේය. ආහාර නොවන කාණ්ඩයේ, රෙදිපිළි හා පාවහන්; විනෝදාත්මක හා සංස්කෘතික; අධ්‍යාපන සහ විවිධ භාණ්ඩ හා සේවා යන උපකාණ්ඩයන්හි සාමාන්‍ය මිල ගණන්වල ඉහළ යාමක් වාර්තා වූ අතර ගෘහභාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු; සෞඛ්‍ය සහ සන්නිවේදන උප කාණ්ඩ මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි. කෙසේ වුවද, ඉන්ධන මිල ගණන් අඩු කිරීම හේතුවෙන් නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන; සහ ප්‍රවාහන යන උප කාණ්ඩවල සාමාන්‍ය මිල ගණන් පහළ ගියේය. මෙම ප්‍රවණතාවයන්හි ප්‍රතිඵලයක් වශයෙන් ආහාර නොවන කාණ්ඩයේ සාමාන්‍ය මිල ගණන් සමස්තයක් ලෙස පහළ වැටිණි.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය පිළිබිඹු කරන මූලික උද්ධමනය ලක්ෂ්‍යමය පදනම මත 2014 දෙසැම්බර් මස පැවති සියයට 3.2 හි සිට 2015 ජනවාරි මාසයේ දී සියයට 2.1 දක්වා පහළ වැටිණි. වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2014 දෙසැම්බර් මස වාර්තා කළ සියයට 3.5 සමග සසඳන විට 2015 ජනවාරි මාසයේ දී සියයට 3.4 ක් විය.